| | | |
|---|---|---|
| | මගේ අංකය | ;- MPS/01/07 |
| | எனது இல | ;- |
| | My No | :- |
| | ඔබේ අංකය | :- |
| | உனது இல | :- |
| | Your No | :- |
| **මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ | දිනය | :- 2022.11.09 |
| **மாலிம்பட பிரதேச சபை - மாலிம்பட** | திகதி | :- |
| **MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA** | Date | :- |

දු.ක./ෆැක්ස් **தொலைபேசி/ தொலைநகல்** Telephone / Fax:- 041-2240208


---

**<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව</u>**
**<u>2022.11.08 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව</u>**

සහභාගීත්වය :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

නොපැමිණීම:-
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 නොවැම්බර් මස මාසික සභා රැස්වීම 2022.11.08 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2022 ඔක්තෝබර් මස 11 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව 2022.10.11 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

2022 ඔක්තෝබර් 27 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව 2022 ඔක්තෝබර් 27 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

***02.සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

ගරු සභික රවිත මොහොට්ටි මහතා අසනීප වීම හේතුවෙන් අද දින සභාවට නොපැමිණෙන බව දන්වා සිටිනවා.

***03.සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- නො 02,බොකුටුගහහේන,දම්පැල්ල යන ලිපිනයෙහි සමන් ලාල් නැමති අය විසින් එවා තිබූ "ඉඩම මැදින් දමන ලද වැසි ජල බටය ඉවත් කර ගැනීම සඳහා" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාරගොඩ ප්‍රදේශවාසීන් ඉදිරිපත් කර තිබූ "මාරගොඩ කළුකද පාර පිළිසකර කිරීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- වැකඩමුල්ල,කොටදූපේ ප්‍රදේශවාසින් විසින් ඉදිරිපත් කර තිබූ " වට රවුම සාදාගැනීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්/තුමියන්ලා විසින් ඉදිරිපත් කර තිබූ "2021/2022 වර්ෂවල විගණන නිරීක්ෂණ වාර්ථා සටහන් නිර්දේශ පිටපත් ලබාගැනීම"යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- සුල්තානාගොඩ,පොල්පැලකැටිය,චමින්ද ප්‍රියශාන්ත සූරියබණ්ඩාර නැමති අය විසින් එවා තිබූ "වගා කටයුත්තක් සඳහා ඉඩමක් ලබා ගැනීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- 2022 වර්ෂයේ ව්‍යාපාර බදු, කර්මාන්ත බදු සහ බලපත්‍ර ගාස්තු හිඟ වාර්තා විෂය නිලධාරී විසින් සභාගත කරන ලදී.
- දෙපැලගොඩ,වෙළදගොඩ,තෙලිජ්ජවිල වී.පී.ප්‍රේමදාස මයා ඇතුළු ප්‍රදේශවාසීන් විසින් "පන්ගොඩ - මුළුපැල්ල මාර්ගයේ කොන්ක්‍රීට් නොකළ කොටස ගමනාගමනයට සුදුසු පරිදි පිළිසකර කරගැනීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

<u>**යෝජනා අංක 5:1**</u>

2022.10.11 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**
2022.10.11 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:2</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කමිටුව සඳහා පහත නම් සඳහන් අය සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

- සෝමසිරි වීරමන් මයා - සභාපති
- එම්.ඩබ්.ජී.දේශානි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
- ඒ.ජී.අංජලිකා උදයන්ති මිය- තාක්ෂණ සේවා නිලධාරි
- කුමුදු ශාන්තත මයා - තාක්ෂණ සේවා නිලධාරි
- අෂාරා පියුමිණී මිය - ආදායම් පරීක්ෂක
- නිහාල් කරුණානායක මයා- කළමණාකරණ සේවා නිලධාරි
- සුරේඛා ජානකි මිය - සංවර්ධන නිලධාරී
- එච්.කේ.එන්.ඉරෝෂිණී මිය - සංවර්ධන නිලධාරි
- පූර්ණිමා ප්‍රියදර්ශනි මෙය - කළමණාකරණ සේවා නිලධාරි
- මධුෂා ලක්මාලි මිය - කළමණාකරණ සේවා නිලධාරි
- ප්‍රදීප් පුෂ්පකුමාර මයා - සංවර්ධන නිලධාරි
- ඩබ්.ඒ.හිරංසා මිය - සංවර්ධන නිලධාරි
- ප්‍රදීපා නෙරංජනී මිය - සංවර්ධන නිලධාරී

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**
මේ භාණ්ඩ සමීක්ෂණ කමිටුවට උපසභාපතිතුමා සහ විමලවංශ ගමගේ මන්ත්‍රීතුමා එකතු කරන්න.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කමිටුව සඳහා පහත නම් සඳහන් අය සුදුසු බවට තීරණය විය.

- සෝමසිරි වීරමන් මයා - සභාපති
- පී.ජී.පාලිත කුමාර මයා - උපසභාපති
- පිටිදූව ගමගේ විමලවංශ මයා - සභික
- එම්.ඩබ්.ජී.දේශානි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
- ඒ.ජී.අංජලිකා උදයන්ති මිය - තාක්ෂණ සේවා නිලධාරි
- කුමුදු ශාන්තත මයා - තාක්ෂණ සේවා නිලධාරි
- අෂාරා පියුමිණී මිය - ආදායම් පරීක්ෂක
- නිහාල් කරුණානායක මයා - කළමණාකරණ සේවා නිලධාරි
- සුරේඛා ජානකි මිය - සංවර්ධන නිලධාරී
- එච්.කේ.එන්.ඉරෝෂිණී මිය - සංවර්ධන නිලධාරී

- පූර්ණිමා ප්‍රියදර්ශනි මෙය - කළමණාකරණ සේවා නිලධාරි
- මධූෂා ලක්මාලි මිය - කළමණාකරණ සේවා නිලධාරි
- ප්‍රදීප් පුෂ්පකුමාර මයා - සංවර්ධන නිලධාරි
- ඩබ්.ඒ.හිරංසා මිය - සංවර්ධන නිලධාරි
- ප්‍රදීපා නෙරංජනී මිය - සංවර්ධන නිලධාරී

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:3</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල 2023 වර්ෂයට බදු දීම සඳහා ගාස්තු නියම කිරීමටත් එම දේපළ ටෙන්ඩර් කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් එල කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

I. තෙලිජ්ජවිල පොදු වෙළඳ පොල
II. මාලිම්බඩ පොදු වෙළඳ පොල
III. හොරගොඩ පොදු වෙළඳ පොල
IV. ශාන්ති වත්ත ඉඩමේ තාවකාලික බෝග වගාව
V. සෙන්ට්‍රල් පාර්ක් ඉඩමේ රබර් හා කුරුඳු එලදාව
VI. පරණවත්තහේන ඉඩම
VII. තෙලිජ්ජවිල පොදු වෙළඳ පොල වැසිකිලි පද්ධතිය
VIII. මාලිම්බඩ පොදු වැසිකිළි පද්ධතිය
IX. අකුරුගොඩ දකුණ ග්‍රාම නිලධාරි වසමේ රෝස්වුඩ් වෙන්දේසි ඉඩමේ රබර් කිරි කැපීම.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා</u>**

සභාපතිතුමා හොරගොඩ පොළ අපි දන්න කාලේ ඉඳලම තිබුණේ අඟහරුවාදා.ඒකට කඩපොළවල්වල දවසක් දෙකක් ගිහිල්ල අවසාන එළවළු ටික ආපු එක ඇත්ත.මිළ අඩුයි. ඒකටත් මිනිස්සු හුරුවෙලා හිටියේ.මොකද හොරගොඩ ඉන්නෙ ආර්ථික මට්ටම අඩු අය. ඒ අය එළවළු ගත්තා. අපි සභාවක් හැටියට ලක්ෂ 10 ක් හා ඊට පස්සේ ලක්ෂ 4ක් වියදම් කරල මාලු ලැලි හැදුවා.වැසිකිළි හැදුවා. හදල පොළ සෙනසුරාදාට දැම්මා.අත්සවයටත් රු.20000.00 ක් විතර වියදම් කළා.සෙනසුරාදා පොළ තිබුණෙත් දවස් 03 යි. ඊටපස්සේ කොරෝනා ගැටලුවත් එක්ක ප්‍රශ්නයක් වුණා. දැන් රට සාමාන්‍ය තත්ත්වයට පත්වෙලා තිබුණත් සෙනසුරාදා පොළත් නෑ. අඟහරුවාදා පොළත් නෑ. අඟහරුවාදා ආපු වෙළෙන්දො ටික සෙනසුරාදාට දාපු නිසා නැවතුණා.මාලු ලැලි හැදුවට ඒ මාලු ලැලිවල එක මාලු කෑල්ලක් තිබ්බෙ නෑ. ඉතින් හරි අපරාධයක් ඒ වියදම් කරපු සල්ලි ටික. මම කියන්නෙ සභාපතිතුමා අපි නැවත මැදිහත් වෙලා වෙළෙන්දො ටික ගෙනල්ල අඟහරුවාදට පොඩියට හරි පොළ පටන් ගන්න අවශ්‍ය පසුබිම සකස් කරමු. මොකද දුප්පත් මිනිස්සුන්ට එහෙම හරි ගන්න එළවළු ටිකක් නැති වුණොත් කළුකඩකාරයො තමයි ඒ මුදල අද හොයාගන්නේ. හොරගොඩ එළවළුවක් ගන්න තැනක් නෑ.එයාලට තෙලිජ්ජවිලට එන්න හැකියාවක් නෑ. ආර්ථික

මට්ටමින් අඩු ජනතාව ඉස්සර හොරගොඩ පොළට ඇවිත් මල්ලක් පුරවල බඩු අරන් ගියා. ඒ නිසා සභාපතිතුමා මේකට අපි නැවත මැදිහත් වෙමු.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

මන්ත්‍රීතුමා මට මතකයි හොඳටම සුල්තානාගොඩ වැව ළඟ හිටපු වෙළෙන්දා වැන් එකකින් අලුත්ම එළවළු ගෙනාවා. දෙනිපිටියෙ වෙළෙන්දො ටිකක් ආවා පොළ ආරම්භ කරපු දවස්වල. හැබැයි කොරෝනා එක්ක පොළ පටන් ගත්ත එක තමයි ප්‍රශ්නයක් වුණේ.මොකද කොරෝනා නිසා මිනිස්සු පොළට බඩු ගෙනියන්න ආවේ නෑ. ඒ නිසා මිනිස්සු පොළට බඩු ගෙනියන්න ආවෙ නෑ. එහෙම නොවුණා නම් ගැටලුවක් වෙන්නෙ නෑ.අපි එහෙනම් ආයෙ අඟහරුවාදට පොළ පවත්වමු. සෙනසුරාදාට දාන්න හේතු වුණේ ජනතාව ඉල්ලුවා අපට අලුත් එළවළු ඕන කියලා. අපි කලින් විදියට පොළ අඟහරුවාදට දාමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:3**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල 2023 වර්ෂයට බදු දීම සඳහා ගාස්තු නියම කිරීමටත් එම දේපළ ටෙන්ඩර් කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් එල කිරීමටත් තීරණය විය.

I. තෙලිජ්ජවිල පොදු වෙළඳ පොල
II. මාලිම්බඩ පොදු වෙළඳ පොල
III. හොරගොඩ පොදු වෙළඳ පොල
IV. ශාන්ති වත්ත ඉඩමේ තාවකාලික බෝග වගාව
V. සෙන්ට්‍රල් පාර්ක් ඉඩමේ රබර් හා කුරුඳු එළදාව
VI. පරණවත්තහේන ඉඩම
VII. තෙලිජ්ජවිල පොදු වෙළඳ පොල වැසිකිලි පද්ධතිය
VIII. මාලිම්බඩ පොදු වැසිකිළි පද්ධතිය
IX. අකුරුගොඩ දකුණ ග්‍රාම නිලධාරි වසමේ රෝස්වුඩ් වෙන්දේසි ඉඩමේ රබර් කිරි කැපීම.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:4**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් සේවකයන් ලෙස සේවය කරන පහත නම් සඳහන් අයගේ සේවා කාලය 2022.11.01 දිනෙන් අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

I. එස්.කේ.එස්.ලියනගේ මයා - සෞඛ්‍ය කම්කරු
II. එරංග නයනප්‍රිය විතානගේ මයා - සෞඛ්‍ය කම්කරු

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**තීරණ අංක 5:4**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් සේවකයන් ලෙස සේවය කරන පහත නම් සඳහන් අයගේ සේවා කාලය 2022.11.01 දිනෙන් අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීමට තීරණය විය.

I. එස්.කේ.එස්.ලියනගේ මයා - සෞඛ්‍ය කම්කරු
II. එරංග නයනප්‍රිය විතානගේ මයා - සෞඛ්‍ය කම්කරු

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය

**<u>යෝජනා අංක 5:5</u>**

කොරෝනා වසංගත රෝගය, ඉන්ධන හිඟය, අධික වර්ෂාපතනය නිසා නඩත්තු කිරීමට නොහැකිවුණු මාර්ග පද්ධතිය සංවර්ධනය කරලීම සඳහා මහ නැගුම, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතන වැනි රාජ්‍ය ආයතන වලින් යන්ත්‍රෝපකරණ බද්දට ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:5</u>**

කොරෝනා වසංගත රෝගය, ඉන්ධන හිඟය, අධික වර්ෂාපතනය නිසා නඩත්තු කිරීමට නොහැකිවුණු මාර්ග පද්ධතිය සංවර්ධනය කරලීම සඳහා මහ නැගුම, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතන වැනි රාජ්‍ය ආයතන වලින් යන්ත්‍රෝපකරණ බද්දට ගැනීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:6</u>**

වෘත්තීය පුහුණුව ලබාගත් අය, ව්‍යාපාරික ප්‍රජාව, කෘෂි කර්මාන්තය හා සත්ත්ව පාලන කටයුතුවල නියලී සිටින අය සඳහා ලබා දෙන ණය පහසුකම් රාජ්‍ය මූල්‍ය ආයතන සම්බන්ධ කරගෙන වැඩමුළුවක් පැවැත්වීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:6</u>**

වෘත්තීය පුහුණුව ලබාගත් අය, ව්‍යාපාරික ප්‍රජාව, කෘෂි කර්මාන්තය හා සත්ත්ව පාලන කටයුතුවල නියලී සිටින අය සඳහා ලබා දෙන ණය පහසුකම් රාජ්‍ය මූල්‍ය ආයතන සම්බන්ධ කරගෙන වැඩමුළුවක් පැවැත්වීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:7</u>**

පහත සඳහන් මාර්ග ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

I. අධිකාරිවිල ගම සමගි මාවත
II. ගල්පොත්තහේන ප්‍රධාන මාර්ගය

III. අලස්වත්ත සුගත් මහතාගේ නිවස අසල සිට අධිකාරිවිල වෙල්යාය දක්වා මාර්ගය

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:7</u>**
පහත සඳහන් මාර්ග ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීමට තීරණය විය.

I. අධිකාරිවිල ගම සමගි මාවත
II. ගල්පොත්තහේන ප්‍රධාන මාර්ගය
III. අලස්වත්ත සුගත් මහතාගේ නිවස අසල සිට අධිකාරිවිල වෙල්යාය දක්වා මාර්ගය

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය

**6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.**

**<u>යෝජනා අංක 6:1</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය කටයුතු,පරිපාලනය,හා සභා කටයුතු සම්බන්ධයෙන් විගණන අධිකාරිය/විගණන අංශය විසින් ලබා දෙන ලද නිරීක්ෂණ සටහන්,උපදෙස්,ඌනතා හා නිගමනයන් පිළිබද 2021/2022 වර්ෂවල වාර්ථා පිටපත් සභික මහත්ම මහත්මීන්ගේ දැනගැනීම පිණිස ලබාදෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.
.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:1</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය කටයුතු,පරිපාලනය,හා සභා කටයුතු සම්බන්ධයෙන් විගණන අධිකාරිය/විගණන අංශය විසින් ලබා දෙන ලද නිරීක්ෂණ සටහන්,උපදෙස් හා ඌනතා හා නිගමනයන් පිළිබද 2021/2022 වර්ෂවල වාර්ථාවල පිටපත් සභික මහත්ම මහත්මීන් වෙත ලබා දීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය

**<u>යෝජනා අංක 6:2</u>**
“ඉමාලි”,මාලිම්බඩ,පාලටුව,මාතර ලිපිනයෙහි පී.ජී.එම්.අයි අමරසේකර යන අයට අයත් නාක්දගොඩහේන නැමති ඉඩමේ කොටස් 2020 හා 2022 වසරවලදී මාතර ජල යෝජනා ක්‍රමය 4 යටතේ ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට පවරා ගෙන ඇත.එබැවින් ඔහු සතුව දැනට ඉතිරිව ඇති ඉඩම් කොටසට පුද්ගලික මාර්ගයක් ලෙස භාවිතා කිරීම සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු නාකන්දගොඩවත්ත ඉඩමෙන් කොටසක් ලබා දෙන ලෙසත් ඒ සඳහා ඔහුගේ ඉඩමෙන් කොටසක් ප්‍රාදේශීය සභාවට ලබා දීමටත් කළ ඉල්ලීම තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

මෙම කාරණය සම්බන්ධව ස්ථානීය පරික්ෂණයක් සිදුකර අදාල පුද්ගලයා සම්බන්ධ වී සාකච්ඡා කර එකී ඉඩම පිළිබඳව වාර්තාවක් සමග ඉදිරි සභාවට මෙම යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:3</u>**

මැදගොඩ ප්‍රජා ශාලාවේ මුදුන් වහල අලුත්වැඩියා කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**

මැදගොඩ ප්‍රජා ශාලාවේ මුදුන් වහල අලුත්වැඩියා කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය

**<u>යෝජනා අංක 6:4</u>**

පහත සඳහන් සුසාන භූමි සඳහා වෙන්කර ඇති භූමි පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනත යටතේ ගැසට් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

I. පිටිවලහේන ඉඩම සුසාන භූමිය
II. අධිකාරිවිලගම සුසාන භූමිය
III. පුවක්දොළ සුසාන භූමිය
IV. භාග්‍යගම මුරිය මුල්ලහේන සුසාන භූමිය
V. සෙන්ට්‍රල් පාර්ක් සුසාන භූමිය

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

පහත සඳහන් සුසාන භූමි සඳහා වෙන්කර ඇති භූමි පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනත යටතේ ගැසට් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවීම සුදුසු බවට තීරණය විය.

I. පිටිවලහේන ඉඩම සුසාන භූමිය
II. අධිකාරිවිලගම සුසාන භූමිය
III. පුවක්දොළ සුසාන භූමිය
IV. භාග්‍යගම මුරිය මුල්ලහේන සුසාන භූමිය
V. සෙන්ට්‍රල් පාර්ක් සුසාන භූමිය

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය

**<u>යෝජනා අංක 6:5</u>**

පිංමුල්ල අලුත්හේන මාර්ගයේ ආරම්භක කොටසේ කැඩී ඇති කොටස් නැවත සකස් කිරීමට ඉදිරිපත් කරන ලද රු.250,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

පිංමුල්ල අලුත්හේන මාර්ගයේ ආරම්භක කොටසේ කැඩී ඇති කොටස් නැවත සකස් කිරීමට ඉදිරිපත් කරන ලද රු.250,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය

**<u>යෝජනා අංක 6:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලයාධිපති විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත පුස්තකාල අයවැයපත පිළිගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලයාධිපති විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත පුස්තකාල අයවැයපත පිළිගැනීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:7</u>**

දිසා අධිකරණයේ විභාග වන L 12569 නඩුව පැමිණිලිකරු විසින් ඉල්ලා අස්කර ගැනීම ප්‍රකාශ කර සිටි බැවින් ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**<u>තීරණ අංක 6:7</u>**

දිසා අධිකරණයේ විභාග වන L 12569 නඩුව පැමිණිලිකරු විසින් ඉල්ලා අස්කර ගැනීමට ප්‍රකාශ කර සිටි බැවින් අදාල මාර්ගය ලබා දීමේ පොරොන්දුව මත මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ එකගතාවය ලබා දීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

2022/10/27 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/11/08 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම

2022/10/11 දින පැවති පරිසර උපදේශන හා පොදු පහසුකම් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

2022 සැප්තැම්බර් මස ලැබීම් හා ගෙවීම් සාරාංශ වාර්තා සභාව වෙත ඉදිරිපත් කිරීම.

2022 ඔක්තෝබර් මස ලැබීම් හා ගෙවීම් සාරාංශ වාර්තා සභාව වෙත ඉදිරිපත් කිරීම.

**9). වෙනත් කරුණු -**

ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ගරු සභාපතිතුමනි, හොරගොඩ ජල ව්‍යාපෘති 2ක් ක්‍රියාත්මක වෙනවා.එකක් මම සාමාජිකත්වය දරන සමගි ප්‍රජා මූල සංවිධානය. ඒ යටතේ පවුල් 160 කට පැය 24 පුරාම ජලය ලබා දෙනවා. සුහද ප්‍රජා මූල සමිතියෙන් පවුල් 42 කට ජලය ලබා දෙනවා.ඒ ලබා දෙන්නේ ළිඳකින් උනන වතුර ටික ටැංකියකට එකතු කරල ඒ ටැංකියෙන් තව ටැංකියකට පොම්ප කරල පවුල් 30 කටත් අර ටැංකියෙන් ගුරුත්ව බලයෙන් පාරට ගෙනල්ල තව පවුල් 12 කටත් ජලය ලබා දෙනවා.හැබැයි ඒ කියන සුහද ජල මූලාශ්‍රයේ තත්ත්වය මං හොඳටම දන්න නිසා වගකීමෙන් කියන්නෙ ඒ ව්‍යාපෘතියේ ජල මූලාශය දියුණු නොකර තවත් එක පවුල් 5කට වත් ජලය ලබා දෙන්න බෑ.මං කාරුණිකව ඉල්ලා සිටිනවා අපේ මන්ත්‍රීවරුන්ගෙන් මේ කාරණාව හොඳින් ශ්‍රවණය කරලා මේකට අනුගත වෙයි කියලා.එහෙම තියන අතරෙ 2019 වර්ෂයේ ඉල්ලීමකින් තොරව ලක්ෂ 10ක් වෙන් වෙනවා .ඒක අපේ සභාපතිතුමා සහ නිලධාරී මණ්ඩලයේ මැදිහත්වීම මත පළාත් නිශ්චිත වැඩසටහන මගින් තමයි වෙන් වෙන්නේ.වෙන් වෙලා ටික දවසක් ගියාට පස්සේ ලක්ෂ 10ටම බඩු ගන්නවා බටයි,ටැංකියි,මෝටරුයි.ඒ වනවිට ඒ සමිතියේ පරිපාලන තත්වයත් ටිකක් දුර්වල වෙලයි තිබුණේ.සමිතිය ලිඛිතව භාර ගත්තට වැඩේ වුනේ නෑ.මෙහෙම යන අතරෙ තමයි අපේ සමිතියේ ජල මූලාශ්‍රයෙන් මුස්ලිම් ගම්මානය දක්වා ජලය ලබා දෙන්න වැඩසටහනක් ආවා යහපාලන රජයේ ජල අභිමානී වැඩසටහන යටතේ.නමුත් ඒකට සැළසුම් හැදුවා ඇස්තමේන්තු සකස් කලා මුදල් නොලැබීම නිසා ඒක අතරමග නතර වුණා.මේ යන අතරවාරෙ තමයි අපේ උප සභාපතිතුමා සාමාජිකත්වය දරණ උස්ගොඩ පුවක්දොළ ජලය ලබා දීමට යෝජනාව ආවේ සභාවෙන්.ඒ වෙලාවේ අපි කථා කරා ඒකට.මිලදී ගැනීම් සම්බන්ධයෙන් එහෙම කතා කරන්න හේතුව වුනේ අපේ සමිතියට PVC නළ සහ උපාංග මිලදී ගන්න ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙන් අපට අවස්ථාවක් දීල තිබුණ.හැබැයි උස්දොළ පුවක්දොළ ව්‍යාපෘතියට ජලය ලබාදෙන කොට කිසිම මන්ත්‍රීවරයෙක් විරුද්ධත්වයක් අකමැත්තක් තිබුණෙ නැහැ.

අපි අර දන්න දේ කිව්වා ඇරෙන්න ඒකට අකුල් හෙලන්න නෙවෙයි ඒ කතාව කිව්වේ.එහෙම සාකච්ජා වට කීපයක් ගියා.ඒ අවස්ථා වලදි අවසන් සාකච්ජාවකදි තීරණය වුණා හොරගොඩ සමිතියට PVC නළ ටික දෙන්නත් උස්ගොඩ පුවක්දොළට අනිත් බඩු ටික දෙන්නත්.එහෙම තීරණය වෙච්ච වෙලාවේ මං කිව්වා හොරගොඩට බඩු ටික දෙන්න අපි නැවත ප්‍රධානයක් විදියට උස්ගොඩට දෙන්නම් කියල.එහෙම කිව්වෙ ඒ වන විටත් අපේ සමිතියට හම්බවෙච්ච දැන් වටිනාකමින් ලක්ෂ 6කට වැඩි මෝටරයක් අපි උප සභාපතිතුමාගේ ව්‍යාපෘතියට දීලා තියනවා.ඒ වගේම තව මෝටරයක් හක්මනට දීලා තියනවා.ඒවාගෙ කිසිම ගැටලුවක් නෑ.මොකද අපේ සමිතියෙ වත්කමක් තවත් සහෝදර සමිතියකට අපි දීලා තියනවා.එහෙම යෝජනා වුණත් අපිට ඒ බට ටික ලැබුණෙ නැහැ.දවසක් උපසභාපතිතුමා කථා කරලා කිව්වා මන්ත්‍රීතුමා හොරගොඩට බඩු ටික එවනවා බාගන්න වැඩපිළිවෙලක් හදන්න කියලා.ක්ෂණිකව තමයි දුරකථන ඇමතුම දුන්නෙ.හොරගොඩට බට 100ක් ලැබුණා.

මීට පෙර 2018.12.12 විශේෂ යෝජනා යටතේ පුවක්දොළට, හොරකැටියට, සෙන්ට්‍රල් පාර්ක් වලට 998,589.00ක් අපි අත උස්සල අනුමත කරල තියෙනවා. මේ ලක්ෂ 10ත් ගියේ හොරකැටියට, පුවක් දොළට. අපි සතුටු වෙනවා ඒ ගම්වලට වතුර ලැබිච්ච එකට. එහෙම

කරල අවසානයේ හොරගොඩට කිසිවක් නැතිව ගියා. ඒ වගේම කලකිරීමට පත්වුණා. මන්ත්‍රීවරු අනන්ත කිව්වා මේකට ව්‍යාපෘති වාර්තාවක් හදන්න කියලා.එකක්වත් හැදුවේ නෑ.හොරගොඩට ව්‍යාපෘති වාර්තාවකුත් නෑ මම දන්න තරමින්.හේවයින් සියලු නිලධාරීන් දැඩි අපහසුතාවයකට පත්වෙලා තියෙනවා. අපේ පරිපාලනේ තිබ්ච්ච කිසියම් අඩුපාඩුවක් නිසා තමයි මේ කටයුතු මේ විදියට සිද්ධවෙලා තියෙන්නේ. ඒ වගේම ඔඩිට් එකක් නිසා නිසා සභාවේ වැඩ කරන්න තිබ්ච්ච කාලය දවස් ගානක් නැතිවෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි, මේ වගේ අඩුපාඩු නොවෙන්න අපි කටයුතු කරමු. ඒ වගේම හොරගොඩ මුස්ලිම් ගම්මානයට වතුර දෙන්න බැරිවුණ නිසා මම අපහසුතාවයට පත්වෙලා තියෙනවා.ඉදිරියේදි මම රැස්වීමක් කැඳවනවා ඔබතුමා එදාට සහභාගිවෙලා  ඇතිවූ තත්ත්වය පැහැදිලි කරල අපි මේකෙන් නිදහස් කරන්න කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා</u>**

මේ ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සභාවේ සියලු මන්ත්‍රීවරු 2018 දී කතා කරන කොට විවේචනයකින් තොරව වතුර දෙන්න කවුරුත් කැමති වුණා. හැමෝම සහයෝගය පලකළා. නමුත් සභාපතිතුමා ඔබතුමාවත්, ලේකම්තුමියවත්,  අනිත් නිලධාරීන්වත් නිහතමානී වුණේ නෑ මේ ගැටලුව විසඳගන්න. මමත් ලසන්ත මන්ත්‍රීතුමත් කිව්වා ලිපිගොනුව සම්පූර්ණ කරගන්න කියලා. ලිපිගොනුව නිවැරදිව සකස් කරල තිබුණනම් පසුවිපරම් විගණනයට අපි ලක්වෙන්නෙ නෑ. අපිට ඒ වෙලාවෙත් තේරුණා මේකෙ වැරැද්දක් තියෙනව කියලා.අපි ඒක නිවැරදි කරගන්න උත්සාහ කළේ නෑ. ඒ නිසානේ සභාපතිතුමා අපි අද මේ තත්ත්වයට පත්වෙලා තියෙන්නේ. මට අරංචියි ඒ ලිපිගොනු දැන්  සභාවෙත් නෑ, ඒ ලිපිගොනුව විගණනයෙන් අරන් ගියා කියලා. මොකද එහෙම අරන් යන්නෙ දෝෂ දර්ශනයට ලක්වෙන කාරණා තියෙන නිසා. නැත්නම් අනෙක් ලිපිගොනුත් අරන් යන්න එපයි. ඒ නිසා සභාපතිතුමනි, මේකෙ වගකීම තියෙන්නෙ ඔබතුමාට.අපි 2018 ඉදන් 2021 වෙනකන් කිව්වත් නිවැරදි වුණේ නෑ. ඒ නිසා සභාපතිතුමා මේ වගකීමෙන් නිදහස් වෙන්න බෑ ඔබ සියලු දෙනාටම. විෂය නිලධාරි විදියට හිටියෙ සංවර්ධන නිලධාරි ධම්මිකා මහත්මිය. ඇත්තටම එතුමිය දන්නෙත් නෑ මේකෙ විගණනය ආවම අන්තිම ඒ මිනිස්සු මේවට කරගහන්නෙ.හිටපු ලේකම්තුමියට මං දොස් කියන්නෙ පෞද්ගලිකව කිව්වා සභාවෙදි කිව්වා අවස්ථා කිහිපයකදිම මොකද මන්ත්‍රීවරු අධිභාරයට ලක්වෙනවා.දැන්වත් සභාපතිතුමා මේව නිවැරදි කරන්න උත්සහ කරන්න.විගණන කටයුතු සම්බන්ධව අපිටත් යම් යම් අවස්ථාවල ගැටලු මතුවෙලා තියනවා.ඒව හදාගන්න නිහතමානි වුණේ නැති නිසා තමයි අද මේ තත්වයට පත්වෙලා තියෙන්නේ.මොකද උදය ශාන්ත මන්ත්‍රීතුමාගේ එම ව්‍යාපෘතිය ගැනත් මට සැකයක් තියෙනවා.කවුරුත් යහපත් චේතනාවෙන් තමයි මේ ජල ව්‍යාපෘති වලට උදව් කලේ නමුත් මේවගෙ ප්‍රශ්න තියෙනවා.අලුත් නිලධාරි යොදාගෙන යම් යම් දේවල් කරන්නෙපා එයාලා මූලා නීති රීති දන්නෙ නැහැ.දැන්වත් නිහතමානීව කටයුතු කරන්න.බොහොම ස්තූතියි.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

දිගින් දිගටම වැරදි පැත්තට යන නිසා මං කථා කරනවා.මේ ජල ව්‍යාපෘතියේ ආරම්භයත් අවසානයත් කියන්නම්.මේ ජල ව්‍යාපෘතිය ආරම්භ කලේ හොරගොඩ මුසලිම් ගම්මානයට වතුර දෙන්න හොරගොඩ සුහද ප්‍රජා මූල සමිතියෙන්.ඒ එක්කම මෙතන නොකියන දෙයක් තියනවා ජනතාවගෙන් දැඩි ඉල්ලීමක් ආවා එක ව්‍යාපෘතියක්  දැඩි මූලා වංචා තියන නිසා ඒ ව්‍යාපෘතිය එක්ක වැඩ කරන්න එපා කියලා.ඒ විතරක් නෙවෙයි අරමුදල් අරගෙන කොන්ත්‍රාත් වැඩ කරනවා කියලා ඒ ව්‍යාපෘතියට බරපතල චෝදනා තියනවා මං ළඟ ලිපියක් තියනවා.ජනතා විරෝධයක් තියනවා ඒ වතුර බොන්න බෑ ලෙඩ රෝග බෝ වෙනවා කියලා.රැස්වීමක් තිබ්බා හොරගොඩ පන්සලේ ප්‍රජා ශාලාවේ.ඒ සියලු දෙනා කිව්වෙ ඒ ව්‍යාපෘතිය එක්ක වැඩ කරන්න එපා කියලා.එහෙම විරෝධයක් ආවට පස්සෙ අපිට සහය දෙන්න බැරි තත්වයක් තිබුණා. හැබැයි මේ සුහද ජල ව්‍යාපෘතිය මගේ තනි තීරණයක් නෙමෙයි.සුහද ජල ව්‍යාපෘතියට ජලය දෙන්න ඕන කියල මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ අපි

කවුරුත් සාකච්ඡා කළා.විශේෂඥ දැනුම තියෙන දැන් කතා කරන අය ඒ වෙලාවේ කියන්න ඕන එහෙමනම් සුහද ප්‍රජා මූල සමිතියට මේක කරන්න බෑ කියලා.කාගෙන්වත් එහෙම අදහසක් ආවේ නෑ.අපි සුහද ජල ව්‍යාපෘතියට දුන්නට පස්සෙ ඒකට බඩු ගෙනාවා.භාරගත්තට පස්සේ ඒක බලන්න TO මහත්තයයි මමයි ගියා. ඊට පස්සෙ එයාලට ප්‍රජා ජල දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය බඩු ටික ලැබිල තියෙනවා ඒ නිසා අපි දුන්න දේවල් අවශ්‍ය නෑ කියල ලිඛිත දැනුම් දීමක් කළා. ඊට පස්සෙ මම තමුන්නාන්සේලා එක්ක සාකච්ඡා කරල සභාවට යෝජනාවක් දැම්මා බට තියෙනවා, මෝටර් තියෙනවා, මේවා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකට දෙමු කියලා. හංගලා කොළේ වහල ගහල නෑ. අපි විශ්වාසයක් ඇතිව වැඩ කරන්නේ.

ඒ අනුව හොරගොඩ සුහද ප්‍රජා මූල සංවිධානය සඳහා මිළදී ගෙන ඇති ජල නල සහ ජල ටැංකි ප්‍රයෝජනයට නොගෙන තිබෙන බැවින් එම ජල නල සහ ජල ටැංකිය අත්‍යවශ්‍යතාවය තිබෙන වෙනත් ක්‍රියාකාරී ජල ව්‍යාපෘතියකට ලබා දීම සුදුසු යැයි ගරු සභාවට මම යෝජනා කළා. සභාවට යෝජනාව දැම්මට පස්සෙ උදයසාන්ත මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා PVC නල ටික සමගි ප්‍රජා මූල සමිතියට ලබා දෙන ලෙස. උපසභාපතිතුමා කිව්වා මෝටර් ටික එයාට දෙන්න කියලා. මේවා අපි සභාවේ කතා කරපුවා.ඊට පස්සේ මුස්ලිම් ගොඩේ රැස්වීමක් තිබුණා.උදයසාන්ත මන්ත්‍රීතුමා කිව්වා සමගි ප්‍රජා සංවිධානයට දෙන්න කියලා. එතනදි අපි පැහැදිලිව කිව්වා බට තියෙනවා කාණු කපා ගන්න ඊට පස්සෙ අපි බට දෙන්නම් කියලා. මොකද බට තියාගන්න තැනක් නෑ. ඒක ලොකු ප්‍රශ්නයක්.ඒ වුණත් බට 100 ක් දුන්නා. වැඩ පටන් ගත්තට පස්සෙ ඉතිරි ටික දෙන්න බලාගෙන.

ඊට පස්සෙ මතයක් ගියා සැමට ජලය ව්‍යාපෘතිය යටතේ වතුර දෙනවා කියලා. කවුරුත් කාණු කපන්න උනන්දු වුණේ නෑ. එක පැත්තකින් උදයසාන්ත මන්ත්‍රීතුමාට ඒක කරන්න බැරි වුනේ ජාතික ජල සම්පාදන මණ්ඩලය කාණු කපනවා කියපු නිසා.එතනදිත් මේක සිද්ද වුණෙ නෑ. ගල්ඇන්දකුට්ටිය ව්‍යාපෘතිය හොඳින් ක්‍රියාත්මක වුණා බෝඩ් එකෙන් ඇවිත් වතුර දුන්නා. පුවක්දොළට,හොරකැටියට,උස්ගොඩට වතුර දීම තුළ අපිට ලොකු ආර්ථික වාසියක් වුණා. සතියකට දවස් තුනක් සභාවේ වියදමින් ජල බවුසරයක් හරහා වතුර බෙදාහරිනවා. ඒවට යන මුදල බලන්න. රියදුරෙකුට, කම්කරුවෙකුට, ඩීසල්වලට යන මුදල සතියකට දවස් තුනක් ඉතිරිවීම තුළ සුවිශේෂී වාසියක් ලැබුණා.හොරකැටිය,පුවක්දොළ ජනතාව දැඩි පීඩනයක හිටියෙ වතුර නැතුව මේ සියල්ල සලකා බලලා තමයි හොරකැටිය පුවක්දොළට වතුර දීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලා කවුරුත් එකග වුණේ. ගල්ඇන්දකුට්ටිය හරහා පුවක්දොළ හොරකැටියට වතුර දීම කළා.වතුර දීමේදී ඒ පැත්ත සාර්ථකව යනවා. ගරු මන්ත්‍රීතුමනි මෙතන ප්‍රශ්නෙ තියෙන්නෙ හොරගොඩට වතුර දෙනවද නැද්ද කියන එකනේ. අපි හොරගොඩට, ඇල්ගිරියට වතුර දෙනවා.මම වගකීමෙන් කියන්නේ.

මේ ඔඩිට් එකේ නිගමනය මට ලොකු වාසියක් වුණා. ගොඩක් අය මෙතන ඉන්නවා ඔඩිට් එකට ලියන අය.මේ මොහොතෙ කතා කරන ඒවා මේ මොහොතෙම යන ඒවා තියෙනවා. සුහද ජල ව්‍යාපෘතියට වතුර නොදීම සම්බන්ධව විගණන විමසුම් ඇවිත් තියෙනවා. එතකොට මම ගිහින් ජල සම්පාදන මණ්ඩලයට ගිහින් කිව්වා ඔබතුමාලා සැමට ජලය ව්‍යාපෘතිය යටතේ වතුර දෙනවා කියල තියෙනවා.ඒක සිදුවුණේ නෑ. අපි ලක්ෂ 10 ක විතර බඩු ගෙනල්ල තියෙනවා.ඒකට අපට විගණන විමසුමක් ඇවිත් තියෙනවා. මේ වගකීම තමුන්නාන්සේලා ගන්න ඕන කියලා DGM ට කතා කළා.නිලධාරීන්ට මේවා ගෙවන්න වෙන්නේ. මේ වතුර ප්‍රශ්නෙ ඔබතුමාලා විසඳන්න කියල කිව්වා. එතුමා ඒ වෙලාවේ කාර්යය මණ්ඩලය රැස් කරල කිව්වා මුලින්ම හොරගොඩට වතුර දෙන්න කටයුතු කරන්න කියලා. මම ගිය දවසට පසුදිනම ජල සම්පාදන මණ්ඩලයෙන් මනින්න ආවා. ඒ නිසා කිසිම මන්ත්‍රීකෙනෙක් දැනුවත් කරන්න ලැබුණේ නෑ. ඒ නිසා සමහර අයට වේදනාවක් ඇතිවෙන්න ඇති. ඉතින් ඒ නිසා හොරගොඩ ජල ව්‍යාපෘතියට ජලය නොදෙනවා කියන්න එපා. අපි හැමදාම බැලුවේ මොන පැත්තකින් හරි හොඳ දෙයක් කරන්න.මම ඒක ඉෂ්ට කරනවා.මන්ත්‍රීතුමා එක ව්‍යාපෘතියක පිරිසිදු ජලය

තියෙනවා. ඔබතුමාගේ ව්‍යාපෘතියෙ ජලය කිවුල් කියන මතය තියෙනවා. ඒ නිසා අපි මෙතනදි බැල්වේ හොඳ වතුර ටිකක් දෙන්න. කිවුල් වතුර මිනිස්සු ප්‍රතික්ශේප කළ නිසයි ඔබතුමාගේ ව්‍යාපෘතියට මුදල් වෙන් කිරීම නතර කළේ. නමුත් ජලය කිවුල් වුණත් ඔබතුමා ලොකු සේවයක් කළා. කැපවෙලා, ක්‍රියාත්මකවෙලා ඔබතුමා කළ ඒ ක්‍රියාවලිය අපි අගය කරනවා. නමුත් හොඳ වතුර ටිකක් ලැබෙයි කියන බලාපොරොත්තුව මිනිස්සුන්ට තියෙනවා. ඒකයි මන්ත්‍රීතුමා සිද්ධ වුණේ. ඊට පස්සේ අපිට තියෙන ප්‍රශ්නේ සුහද ප්‍රජා මූල සමිතියට දීපු බටටික ගැන. පළාත් පාලන දෙපාර්තමේන්තුවට යැව්වට පස්සේ එහෙන් කිව්වේ ක්‍රියාවලියට පටහැනි වුණත් ඔබතුමා හොඳ වැඩක් කරල තියෙනවා. ඒ නිසා අනුමත කරනවා කියලා.

**ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා**

සමගි ප්‍රජාමූල සංවිධානය ප්‍රා දේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සමිතියක්. පසුගිය කාලය පුරාවට ගමේ සල්ලි ගමටම යොදවල කර්මාන්ත 6ක් 7ක් විතර කරල තියෙනවා.ඒක ලියාපදිංචි සමිතියකට තියෙන අයිතිවාසිකමක්. කවුරුහරි කිව්ව පලියට පොඩි දෙයක් අල්ලගෙන චෝදනා කරන්න එපා. ඔබතුමා දේශපාලන වශයෙන් ගහනවා නම් අපිට ගහන්න. ඒවට උත්තර ඔබතුමාලට පහුගිය කාලේ ලැබුණා. ඊළඟට ඔබතුමා කිව්වා මේ වතුරවලින් ලෙඩ රෝග බෝ වෙනවා කියලා. ඒක බරපතල ප්‍රකාශයක්. හෙට ඉඳල අපි වතුර නොදුන්නොත් ඔබතුමාට සිදුවෙනවා බවුසරයකින් හරි වතුර ගෙනත් දෙන්න. අපි මාසිකව PHI හරහා ජල සම්පාදන මණ්ඩලය හරහා සමත මණ්ඩලයට වාර්තාවක් යවනවා. ජලයේ කිවුල තියෙන එක ඇත්ත. හැබැයි ලෙඩරෝග බෝ වෙනවා කියල කවුරුහරි කියනවා නම් ඔබතුමා වුණත් කමක් නෑ ඒ වගකීම ගන්න. මොකද මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ලෙඩරෝග පැතිරෙන වතුර දෙන්නෙ නැතිව බවුසර්වලින් හරි වතුර ගිහින් දෙන්න. සභාපතිතුමා අපේ සමිතියේ ලක්ෂ 25ක ස්ථාවර වත්කම් තියෙනවා. කවුරුහරි කේලම්කාරයෙක් කියනවා ඇති අපි හොරා කනවා කියලා. මළගෙදරක් උනාම අපේ සමිතියෙන් එවෙලේම රු.10000.00 ක් ගිහින් දෙනවා. මාලිම්බඩ කොට්ඨාසයේ මොන සමිතියෙන්ද එහෙම කරන්නේ. රෑ ද දවල්ද කියල නෑ කරන්න තියෙන දේ අපි කරනවා. කරුණා කොඩිතුවක්කු මැතිතුමාගේ රු.50000.00 ක පරිත්‍යාගයක් දෙන්න සූදානම් වෙද්දි අපේ සමිතියට දෙන්න එපා උදයසාන්ත ඉන්නවා කියලා හොඳ ධානපතියො ඉන්න මිතුරු හවුලකට දීල තියෙනවා. ඔන්න ඕකයි තත්ත්වේ.

**ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා**

මගේ නම නොකියා කිව්වා වුණත් මම කතා කරන්න හිතුවා මේ ජල ව්‍යාපෘතිය ආරම්භ කරපු කෙනා වශයෙන්. හොරගොඩ මෝටරය ගැන කතා කළානේ.හොරගොඩ වසම් තුනටම මුලින්ම වතුර දීපු කෙනා මම.2015 ආණ්ඩුව පෙරළෙන කොට අපිට හම්බවෙච්ච ජල මෝටරය දෙන්න ක්‍රමයක් තිබුණෙ නෑ. හොරගොඩට දුන්නා.දවස් තුනක් හොරගොඩ පන්සලේ තිබිල රෑ 3ක් ඒ ආයතනය ඇවිල්ල මෝටරය සවි කළේ. ඒ ආණ්ඩුව පෙරළෙන කොට ඔය ලක්ෂ 10 එන්නෙ හොරගොඩට වතුර දෙන්න නෙමෙයි, අකුරුගොඩ උතුරට දෙන්න. සභාපතිතුමා ගිහින් ඕක වෙනස්වීම් කරල පළාත් නිශ්චිත යටතේ ඔය විදියට ගත්තේ. මං ස්තුතිවන්ත වෙනවා කවුරුත් සම්බන්ධ වෙලා වතුර වැඩේ යථාර්ථයක් කළාට.විමලවංශ මන්ත්‍රීතුමා චෝදනා කළානේ සල්ලි ගන්නවා කියලා. ඔව් අපි රු.5000.00ක් ගන්නවා ජල මීටර්වලට.ඔය ව්‍යාපෘතිවල තත්ත්වය තිබුණේ අපි ශ්‍රමය දෙන්න ඕන. නමුත් ශ්‍රමය දෙන්නැති අයගෙන් ඒ මුදල අයකර ගත්තා.ඒ තීරණය එදා ඉඳල තිබුණා.

කවුරුහරි කියන පලියට , කාටහරි විගණනයක් කරන්න ඕන පලියට මම දන්නවා මගේ නම දාලා කවුරුහරි පෙත්සම් ගහල තියෙනවා. කරුණාකරල ඒ දේ කරන්න එපා.ඔයාලට මං ගැන සැකයක් ඇති. ඒක සාධාරණයි.මොකද තමන් කරන වැඩ ගැන තමන් දන්න නිසා.මේ අවුරුදු 25 ක දේශපාලන කාලය තුළ මම අනුන්ගෙ සත 5ක දෙයක් ගත්තෙ නෑ. මම අදත් රෑ 2 වෙනකන් මිනිස්සුන්ට වතුර දෙනවා.මම උදයසාන්ත මන්ත්‍රීතුමාටත් ස්තූතිවන්ත වෙනවා.

එතුමත් මේ කාර්යය කරනවා. බලන්න අපි සභාවට කොච්චර ඉතුරුවක් කරල තියේද කියලා.මේ වගේ වතුර ව්‍යාපෘතියකට පෙත්සම් ගහන එක ගැන දුකයි. මේ කරන එකා කවුරු වුණත් ඌට ජාති ජාතිවත් වතුර හම්බවෙන්න එපා.මේ වගේ කාර්යයකට පෙත්සම් ගහන නිසා.කාටහරි ඕන නම් අපට ගහන්න වෙන ඕන ක්‍රමයකට ගහන්න. රු.5000.00ක් ගත්තා කියනවා. ඔව් අපි 5000.00ක් ගත්තා. මං එනකොට රු.39000.00ක් තිබුණු ව්‍යාපෘතියෙ අද ලක්ෂ 5ක් තියෙනවා. හැබැයි අද අපට ප්‍රශ්නයක් තියෙනවා. අද වතුර බිල ගෙවාගන්න බෑ. මෙච්චර දවසක් රු.28000.00ක් ආපු වතුර බිල අද එක්ලක්ෂ පන්දාහයි. රු.17000.00ක් ආපු ලයිට් බිල අද රු.48000.00යි. මිනිස්සුන්ගෙන් සල්ලි ඉල්ලන්න වෙනවා. නඩත්තු භාරකරුට රු.10,000.00 ක් 15,000.00ක් දෙන්න ඕන. අද වෙනකන් මේ 10,000.00 දුන්නෙ මං. එහෙව් අපට මෙහේ පෙත්සම් ගහනවා.

ඔව් බට ටික ගත්තා. මේ ටික නිකන් තියෙන නිසා විගණන විමසුම් එනවා කියල නිලධාරීන් කියනවා. උදයසාන්ත මන්ත්‍රීතුමා හරහා බට ටික ඉල්ලුවා. ඉල්ලපු ප්‍රමාණය, වලදාපු ප්‍රමාණය, තියෙන ප්‍රමාණය අපි නිවැරදිව කියල තියෙනවා. මේවා ඕන අපට ගහන්නද? කමක් නෑ අපට ගහන්න. මේ සියලු මන්ත්‍රීවරු මේ කාර්යයට සත්භාවයෙන් අත්සන් කළා.වතුර දෙන්න අපි කැමතියි කිව්වා. හැබැයි නිලධාරීන් හෝ දේශපාලනය හෝ මේ කාර්යය සම්බන්ධයෙන් මේ ආකාරයෙන් කටයුතු කරනවා.මාව මේ මන්ත්‍රී ධුරයෙන් බැහැර කරන්නද? බැහැර වෙන්නද? ඒ පුද්ගලයාගේ වුවමනාව තියෙන්නේ. මං ඕන වෙලාවක අයින් වෙන්න සූදානම්. අපි කරන්නෙ සමාජ මෙහෙවරක්. පිරිසිදු ජලය සැමට දීම සඳහා අපි උත්සාහ කරනවා. අපිට විගණන විමසුමක් හෝ වෙනත් ගැටලුවක් තියෙනවා නම් අපි එකතුවෙලා මුහුණ දෙමු. ඒකට මුහුණ නොදී එකිනෙකා පරයා ජයග්‍රහණයන් ලබා ගන්න අවශ්‍ය නෑ. නිලධාරීනුත් බේරගෙන අපිත් බේරගෙන කටයුතු කරමු. මගේ පැත්තෙන් වැරැද්දක් වෙලා තියෙනවා නම් මම ඒ වැරැද්ද භාරගන්න සූදානම්. හැමදාම අකුරුගොඩට පුවක්දොළට වතුර දෙන්න සහයෝගය දුන්න හැමෝටම ස්තූතියි. හොරගොඩට වතුර දෙන්න අපිට මැදිහත්වෙන්න පුලුවන්නම් අනිවාර්යෙන්ම ඒකට මැදිහත් වෙලා හොරගොඩට වතුර අරන් දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬවෙනවා.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව